බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ අංක : 03/2015.

මාගේ අංක : කේ 06/සමා/2014,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2015.01. 07 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**<u>සමාවන් සැකසීම සහ සිරගොණු සඳහා සමා අනුමැතිය ලබාගැනීම .</u>**

2004.10.28 දිනැති අංක :- 29/2004 දරණ චක්‍රලේඛයට අමතර වශයෙනි.

සමාවන් සකස්කිරීම හා සිර ගොණු සමා අනුමැතිය සඳහා බන්ධනාගාර මූලස්ථානය ඉදිරිපත් කිරීමේදී බොහෝ අඩුපාඩු සහිතව මෙන්ම සමාවන් සැකසීමේදී විවිධ ක්‍රමවේදයන් අනුව සමාව සැකසීම කරන බැව් පෙනීගොස් ඇති බැවින් සියළු ආයතනයන් එක් ක්‍රමවේදයකට අනුව ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය මත පවත්වනලද වැඩමුළු වලදී එළඹුනු එකඟතාවයන්ට අනුව පහත කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමුකර ඉදිරියේදී ඊට අදාලව කටයුතු කරන ලෙස දන්වමි.

01). එකම නඩුවේ චෝදනා කිහිපයක් සඳහා වෙන් වෙන් වශයෙන් අනිවාර්ය දඬුවමක්, දඩ නොගෙවීම මත සිර දඬුවමක් සහ වන්දි නොගෙවීම නිසා සිර දඬුමක් නියමකර ඇත්නම් සිරගොණුවේ පෙළගැස්විය යුත්තේ පළමුව අනිවාර්ය සිරදඬුවමත් දෙවනුව වන්දි නොගෙවීම නිසාවන සිර දඬුමත් සහ දඩ නොගෙවීම මත වන සිර දඬුවම වශයෙනි.

02). යම් දඬුවම් බලපත්‍රයක චෝදනා කිහිපයක් සඳහා වෙන් වෙන් වශයෙන් දඩ මුදල් නොගෙවීම මත සිර දඬුවම් නියමකර ඇත්නම් වටිනාකමින් වැඩි දඩ මුදල් පිළිවෙලට පෙළගැස්විය යුතුය. දඬුවම් බලපත්‍ර දෙකකින් දඬුවම් කර ඇත්නම් දෙවන බලපත්‍රයේ අනියම් දඬුවම් (දඩ නොගෙවීම මත වන දඬුවම්) බලපත්‍රයේ නියමකර ඇති පිළිවෙලට සැකසිය යුතුවේ.

උදා :- රු.5000/ නොගෙවීම මත මාස 03ක්, රු.15000/ නොගෙවීම මත මාස 06 ක් සහ රු.1000/ නොගෙවීම මත මාස 01 වශයෙන් නියමකර ඇත්නම් රු.15000/ මාස 06 පළමුවත් රු.5000/ මාස 03 දෙවනුවත් සහ රු.1000/ මාස 01 වශයෙන් පෙළගැස්විය යුතුය.

03). යම් දඬුවම් බලපත්‍රයක විශේෂ රාජ්‍ය සමාවන් හිමි සහ අහිමි චෝදනා කිහිපයක් සඳහා දඬුවම්කර ඇත්නම් දඬුවම් බලපත්‍රයේ සඳහන් චෝදනා පිලිවෙලට සිරගොණුවේ පෙළගැස්විය යුතුය.

උදා :- අයුතු ඇතුල්වීම, තුවාල සිදුකිරීම සහ දේපල මංකොල්ල කෑම යන චෝදනා සඳහා පිළිවෙලින් පළමු චෝදනාව සඳහා මාස 03ක සිර දඬුවම්, දෙවන චෝදනාව සඳහා මාස 06 ක සිර දඬුවම් සහ තුන්වන චෝදනාව සඳහා 05 ක් වශයෙන් දඬුවම් වියමකර ඇත්නම් මෙම පිළිවෙලටම සිර ගොණුවෙහිද පෙළගැස්විය යුතුය.

04). විශේෂ රාජ්‍ය සමාව හිමිවන සහ අහිමි චෝදනා දෙකක් එකවර ගෙවියාමට නියමකර ඇත්නම් සමාව අහිමි චෝදනාව සඳහා වන සිර දඬුවම මුලින් ගෙවෙන ලෙස සලකා කටයුතු කලයුතු අතර, එම සමාව අහිමි චෝදනාවේ දඬුවම් කාලසීමාව තුල විශේෂ සමාව පිරිනමන්නේ නම් සමාව ලබා නොදියයුතු අතර, එම කාලසීමාව අවසානයේ විශේෂ සමාව ප්‍රධානය කරන්නේ නම් එම සමාව ලබාදිය යුතුය.

05). විශේෂ රාජ්‍ය සමාවකදී යම් සිරකරුවකුට නියමකර ඇති එක් දඬුවමක් අහෝසිවී ඉදිරියට ක්‍රියාත්මක කිරීමට ඇත්තේ මාස 01 ක සිර දඬුවමක් නම් එම මාස 01ක සිර දඬුවමට ලබාදිය යුත්තේ 1/3 සමාව වේ. එනම් එම සිරකරු දඬුවම් විඳිය යුතු වනුයේ දින 20 ක කාලයක් වේ.

06). නිවාස නිවාඩු ගොස් පැමිණීමට නියමිත දිනයට යම් සිරකරුවකු නොපැමිණිය හොත් එකී සිරකරු පැනගිය සිරකරුයේ සලකා කටයුතු කල යුත්තේ සිරකරු නැවත පැමිණීමට නියමිත දිනයේ පටන් වේ.

තවද, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ 29/2004 පරිදි සිරගොණු නිසි පරිදි පවත්වාගෙන යාමටත් සමා අනුමැතිය සඳහා සිරගොණු ඉදිරිපත් කිරීමේදී නිවැරදි ක්‍රමවේදයන්ට අනුව කටයුතු කිරීමටත් වගබලාගත යුතුය.

චන්ද්‍රරත්න පල්ලේගම,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.